මගියා ෂෙයිතානුවෙකි. මගීන් දෙදෙනා ෂෙයිතානුන් දෙදෙනෙකි. මගීන් තුන් දෙනා මගී පිරිසකි.

අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් ඉබ්නු ආස් -රළියල්ලාහු අන්හුමා- විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. ((මගියා ෂෙයිතානුවෙකි. මගීන් දෙදෙනා ෂෙයිතානුන් දෙදෙනෙකි. මගීන් තුන් දෙනා මගී පිරිසකි.))
[හසන් ගණයට අයත් හදීසයකි] [ඉමාම් තිර්මිදි එය වාර්තා කර ඇත - ඉමාම් අබූ දාවූද් එය වාර්තා කර ඇත - අහ්මද්
එය වාර්තා කර ඇත - ඉමාම් මාලික් එය වාර්තා කර අැත]

තනි පුද්ගලයකු ගමන් කිරීමෙන් වැළකී සිටිය යුතුය. දෙදෙනෙකු ගමන් කිරීම ද එලෙසය. මෙය අදාළ වනුයේ කිසිවකු ගමන් නොකරන පාළු තැන්වලින් ගමන් කරන විටදීය. ගමනේදී එක්ව පිරිසක් සමග ගමන් කිරීම දිරිගන්වන සුළු කරුණකි. තනි පුද්ගලයකු වූ කලී, අවශ්යතාවක් ඇති වූ විටෙක හෝ මරණයට පත් වූ විටෙක හෝ තමන්ට පිහිට වන තරමට එමෙන්ම ෂෙයිතාන්ගේ කුමන්ත්රණ ඇති නොවන තරමට කෙනෙකු සිටිය යුතුයි යන්න පැහැදිලිය. මගී දෙදෙනෙකු වූ කලී, ඇතැම් විට ඔවුන් දෙදෙනාගෙන් එක් අයකුට යම් අනතුරක් සිදු වුවහොත් අනෙකා තනිවනු ඇත. නමුත් වර්තමානයේ මෝටර් රථයක හෝ එවන් යම් වාහනයක, අධිවේගී මාර්ගයක මගීන් සමග ගමන් කිරීම වූ කලී. එය තනිව ගමන් කිරීමක් ලෙස සලකනු නොලැබේ. මගියා ෂෙය්තානුවකු ද නොවේ. හේතුව ඔවුන් සියලු දෙනාම කණ්ඩායමක් මෙන් ගමන් කරන බැවිනි. මෙවන් මාර්ගයට උදාහරණයක් ලෙස මක්කාහ් හා රියාද් අතර මාර්ගයත් මක්කාහ් හා ජිද්දා අතර මාර්ගයත් ගත හැක. නමුත් මගීන්ගෙන් සැදුම් නොලත් තනි මාර්ගයක ගමන් කරන්නේ නම් එය පුද්ගලයකු ගමන් කරන්නක් ලෙස සලකනු ලැබේ. එවිට එය ද මෙම හදීසයට අැතුළත් වනු ඇත.

http://www.sunnah.global/hadeeth/si/show/5938